[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 08 ශ්‍රේණිය | නර්තනය | I, II පත්‍රය | පැය දෙකයි |
|---|---|---|---|

නම ........................................................................................................................................................

**සැලකිය යුතුයි :**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බෙර වාදනයෙන් තොරව අභ්‍යාසයේ යෙදෙන්නේ,

(1) වන්නම් ය (2) පා සරඹ ය (3) අත් සරඹ ය (4) වට්ටම් ය

02. තනිතිතේ ප්‍රභේද ගණන ලෙස ගැනෙන්නේ,

(1) 3 කි (2) 2 කි (3) 4 කි (4) 5 කි

03. පැවිය ගල් රුහැන් ජය රුස් වඩින්නට......... මෙය,

(1) ගොයම් කවියකි (2) පැල් කවියකි (3) සවරං කවියකි (4) වන්නම් කවියකි

04. නර්තන නිර්මාණයේදී යොදාගනු ලබන චලන වර්ග ගණන වන්නේ,

(1) 1 කි (2) 5 කි (3) 4 කි (4) 3 කි

05. දේශීය කැටයම් කලාවේ සුවිශේෂී සැරසිලි නිර්මාණයක් ලෙස,

(1) දඬු බෙරය (2) බටනලාව (3) ගොප් ගෙඩිය (4) ගැට බෙරය

- **ගැලපෙන පිළිතුර යා කරන්න.**

| | |
|---|---|
| 06. වන්නමකි | • විකල්ප වාද්‍ය භාණ්ඩයකි |
| 07. ගැමි නැටුමකි | • තුරඟා |
| 08. ටිං බෙරය | • පතුරු |
| 09. පා සරඹ නැටීමට | • ජිං ගත ගො ගො |
| 10. බෙර පදයකි | • දණ්ඩි කඳ |

- **පහත සඳහන් වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණද වරහන තුළ යොදන්න.**

11. සඳවට තරුවැල් ඇවිදින්.......... මෙය කුළු කවියකි. (.........)

12. ගෙම්බන් කැ ගැසීම, මෙරු පියැඹීම වැස්සක පෙර නිමිති ඵල කරයි. (.........)

13. ''මණ්ඩියට'' සිටීමේදී දෙපා අතර පරතරය වියතයි. (.........)

14. නම්‍යතා අභ්‍යාසව නිරත වීමන් නර්තනය සඳහා අවශ්‍ය ශාරීරික සමබරතාවය ලබාගත හැකිය. (.........)

15. උඩ පැනීමේ ඉරියව්ව අයත්වන්නේ බිම් තලයටය. (.........)

- **සුදුසු වචන යොදා ප්‍රහේලිකාව පුරවන්න.**

| | | | |
|---|---|---|---|
| 16. පැ | | | 17. වි |
| 19. බි | | ත | |
| 18. ක | | | |
| 20. අ | | ■ | |

**හරහට**

16. ජනකවි විශේෂයකි.

18. ද්‍රවිඩ ගැමි නැටුමකි.

19. අවකාශ භාවිතයේදී යොදාගනු ලබයි.

20. චලන නිර්මාණයේදී අංග / ප්‍රත්‍යංග / උපාංග යන කොටස් ඉතා වැදගත් වේ. මෙය '' අංග '' යන කොටසට අයත් ශරීර කොටසකි.

**පහලට**

17. වේගය අඩුවෙන්ම නර්තනය කරනු ලබන ලයකි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) උඩරට හෝ පහතරට සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්තිකර්මයක් සඳහන් කරන්න.

(ii) ඔබ ඉගෙනගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටලය නම් කරන්න.

(iii) ජීවන වෘත්තීන් හා බැඳි ගැමි නැටුම් 2 ක් ලියන්න.

(iv) සමූහ වාදනයක් සඳහා දෙතිතට අයත් බෙර පදයක් ලියන්න.

(v) විකල්ප වාද්‍ය භාණ්ඩයක් යනු කුමක්ද?

(vi) විකල්ප වාද්‍ය භාණ්ඩ 2 ක් නම් කරන්න.

(vii) තාලම්පටින් නිකුත් වන ප්‍රධාන ශබ්ද දෙක නම් කරන්න.

(viii) ''මිහින්තලය අටසැටලෙන සේල චෛත්‍යා වෙහෙරට'' මෙම පද්‍යයේ මීලඟට එන පද්‍ය ලියා දක්වන්න.

(ix) නවරාත්‍රී උත්සවය පැවැත්වීමේ හේතු 2 ක් සඳහන් කරන්න.

(x) පා සරඹ යනු කුමක්ද කෙටියෙන් පැහැදිලි කරන්න. (1 x 10)

02. (i) සවරං නර්තනයේ සුවිශේෂත්වය කෙටියෙන් සඳහන් කරන්න. (ල. 4)

(ii) සවරං නර්තනය ලී කෙලි නර්තනයෙන් වෙනස්වන්නේ කෙසේද යන්න කෙටියෙන් සඳහන් කරන්න. (ල. 4)

(iii) සවරං නර්තනයට සුදුසු ඇඳුමක් සහිත සවරම රැගෙන නර්තනයේ යෙදෙන අයෙකුගේ හැඩතලයක් චිත්‍රයට නගන්න. (ල. 2)

03. පහත සඳහන් මාතෘකා අතුරෙන් 2 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) පහතරට බෙරය

(ii) සතර බීජාක්ෂර

(iii) පතුරු නැටුම

(iv) වන්නම් (5 x 2)

04. (i) මාත්‍රා 3 තනි තිතට අයත් කවියක් ලියා දක්වන්න. (ල. 3)

(ii) මැදුම් තනි තිතට අයත් වන්නමක බෙර පදය ප්‍රස්තාර කරන්න. (ල. 4)

(iii) ප්‍රස්තාර කළ මෙම බෙර පදයට සුදුසු වාද්‍ය භාණ්ඩයක් ඇඳ පෙන්වන්න. (ල. 3)

[සියලු ම හිමිකම් ඇවරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]



# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 08 ශ්‍රේණිය | නර්තනය | පිළිතුරු පත්‍රය |
|---|---|---|

නම ........................................................................................................................

01. (2) 02. (1) 03. (3) 04. (4) 05. (3)

06. තුරඟා 07. පතුරු 08. විකල්ප වාද්‍ය භාණ්ඩයකි 09. දණ්ඩි කඳ 10. ජිං ගත ගො ගො

11. ✗ (සවරං කවියකි) 12. ✓ 13. ✗ (මිටිරියනයි) 14. ✓ 15. ✗ (උස්තලය)

16. පැල් කවි 17. විලම්භ 18. කරගම් 19. බිම්තල 20. අත්

### II කොටස

01. (i) උඩරට නර්තන සම්ප්‍රදාය - කොහොඹා යක් කංකාරිය

පහතරට නර්තන සම්ප්‍රදාය - දෙවොල් මඩු ශාන්තිකර්මය

(ii) උඩරට නර්තන සම්ප්‍රදාය - වෙස් ඇඳුම් කට්ටලය

පහතරට නර්තන සම්ප්‍රදාය - තෙල්මේ ඇඳුම් කට්ටලය

(iii) කළ / කුළු / මෝල්ගස් / ගොයම් .........

(iv) දොං ජිං ත - ගත දොං ත

(v) අවට පරිසරයෙන් ලෙහෙසියෙන් සාදාගත හැකි, ඉවතලන අමුද්‍රව්‍ය යොදා සාදාගතහැකි වාද්‍ය භාණ්ඩ

(vi) ටිං බෙරය, ගස්ලබු නලාව

(vii) තිත් , තෙයි

(viii) අඹතලාව මිරිසවැටිය භයාගිරිය නම් වෙහෙරට ආ........

(ix) 1. ද්‍රවිඩ ජනතාවගේ උත්සවයක් වන අතර අස්වනුවල සශ්‍රීකත්වය උදෙසා

2. දෙවිවරුන්ගේ ආශිර්වාදය උදෙසා

3. අධ්‍යාපන කටයුතු සඳහා ආහිර්වාදය පතා නවරාත්‍රී උත්සවය පවත්වනු ලැබේ.

(x) නර්තන කලාව හදාරන ආධුනික ශිල්පියාගේ පාද චලන නර්තනයට හුරුකර ගැනීම සඳහා කරනු ලබන විශේෂ පද කොටසකි. සංඛ්‍යාවෙන් 12 වන අතර සම්ප්‍රදායන් තුනටම පොදු වේ.

02. (i) දේශීය ගැමි නැටුම් අතර සවරං නැටුම ඉතා අලංකාර වූ ගැමි නැටුමකි. සවරං ලී දෙක දැතින් ගෙන කරකවමින් නර්තනයේ යෙදන මේ නැටුමේදී ගායනය කරනු ලබන කවි විශේෂය සවරං කවි ලෙස හඳුන්වා දිය හැකිය. නර්තනය කිරීමට පෙර සියලු දෙවියන්ගෙන් අවසර ලබා ගැනීම මෙහි විශේෂත්වයකි. විනෝදාස්වාදය මත නිර්මාණය වී ඇත.

- විවිධ තාලරූප අනුව මෙම කවි ගායනය කළ හැකිය.
- විවිධ නාද මාලාවලින් යුක්ත වේ.
- ලීයේ මැදින් අල්ලා චලනය කරයි.

(ii) • ලී කෙලි නර්තනයේදී ලී එකිනෙකට වද්දමින් නර්තනයේ යෙදෙයි. නමුත් සවරං නර්තනයේදී ලී කෙලි ගැටීමක් සිදු නොවේ.

- රංග භාණ්ඩවල වෙනස්කම් ඇත. ලී කෙලියේ සවරං දෙපැත්තේ නැත. නමුත් සවරං උපකරණයේ දෙපැත්තේ සවරං යොදා ඇත.
- සවරම අඟල් 2 ක් පමණ රවුම් අඟල් 18 පමණ දිග වේ. ලී දණ්ඩේ දෙපස එල්ලා වැටෙන සේ රැලි යොදා සකස් කරගත් උපකරණයකි. ලීයෙහි මැදින් අල්ලා චලනය කිරීම විශේෂ වේ. මෙය ලී කෙලි නර්තනයෙන් වෙනස්ව දැකිය හැකි ලක්ෂණ වේ.

(iii) චිත්‍රය බලා සුදුසු ලෙස ලකුණු පිරිනමන්න.

03. (i) පහතරට බෙරය

පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ. මෙම බෙරය විවිධ නම්වලින් හඳුන්වනු ලැබේ. දික් බෙරය, ගෝෂක බෙරය, යක් බෙරය, දෙවොල් බෙරය ආදිය ලෙස පෙන්වා දිය හැකිය.
මේ ලෙස සඳහන් කර ඇතිනම් ලකුණු ලබා දෙන්න.

(ii) සතර බීජාක්ෂර

දේශීය බෙර වාදන සඳහා පොදු වූ මූලික ධ්වනි 4 කි. මේව සතර බීජාක්ෂර ලෙස හැඳින්වේ. උඩරට, පහතරට, සබරගමු බෙර වාදනයේදී බීජාක්ෂර භාවිතා වේ.

උදා : උඩරට තත් ජිත් තොං නං

ආදී ලෙස සඳහන් කර ඇතිනම් ලකුණු පිරිනමන්න.

(iii) පතුරු නැටුම

සාමූහිකව නර්තනයේ යෙදෙන ගැමි නැටුම් විශේෂයකි. පතුරු නැටුමටම ආවේණික රංග උපකරණයක් ඇත. එය ඉතාමත් ආකර්ෂණීය නර්තනයක් ලෙස ගත හැකිය. ශරීරයේ විවිධ ස්ථානයන්ට තැලීම තුලින් හඬ උපදවා ගනී.

(iv) වන්නම්

නර්තන සම්ප්‍රදායන් තුනටම ආවේණික වේ. උඩරට වන්නම් 18 වශයෙන්ද, පහතරට වන්නම් 32 වශයෙන් ද, සබරගමු වන්නම් 18 වශයෙන් ද පෙන්වා දිය හැකිය. මේ වන්නම්වලින් යම් සිද්ධියක්, සතෙක්, වස්තුවක් පිළිබඳ වර්ණනා කිරීම සිදු කරයි.

04. (i) • අගය වඩන කවි වරුණා - රඟය දැනෙයි කළ රචනා......

- කිපී ලොව දිලෙන තෙද තිලොනිඳුගේ
  හැපී දුක් රැසින් උන් සත ගොස් නොලගේ....... ලියා ඇතිනම් ල. 3 යි.

(ii)

| | | | | |
|---|---|---|---|---|
| උඩරට බෙර පදය | 1 2 3<br>ජිං - ග | 1 2 3<br>ත ගො ගො | 1 2 3<br>ජිං - ග | 1 2 3<br>ත ගො ගො |
| පහතරට බෙර පදය | දො දොම් -<br>දො දොම් - | දොම් - ග | දි කි ට | ග දි ත |

(iii) ගැට බෙරය හෝ පහතරට බෙරය ඇඳ ඇත්නම් ලකුණු පිරිනමන්න.

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**